# (උ) මිල හා වැටුප්

## මිල

පසුගිය වර්ෂවල දී මෙන්ම 1967 වර්ෂය තුළ දී සිදු වූ පාරිභෝගික මිල වෙනස්වීම පිළිබඳව කරන පහත දැක්වෙන විශ්ලේෂණය ද බොහෝ දුරට පදනම් වී ඇත්තේ සංගණන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කර ඇති කොළඹ පාරිභෝජන මිල දර්ශකය මතය. සාමාන්‍ය මිල මට්ටමෙහි වෙනස්වීම විදහා දැක්වීමේ දී, මෙම දර්ශකයෙහි ඇති අඩුපාඩුකම් පිළිබඳව, පසුගිය දෙවර්ෂයෙහි වාර්ෂික වාර්තා මගින් පෙන්වා දෙනු ලැබිය. 1952 දී දර්ශකය සැකසීමේ දී ගත් භාණ්ඩ වලින් සමහරක්, වර්තමානයේ දී එතරම් පහසුවෙන් ලබා ගැනීමට නොහැකි බැවින්, මෙම දර්ශකය වඩාත් සතුටු දායක ලෙස මිල වෙනස්වීම් දක්වන්නක් ලෙස සකස් කිරීමට ප්‍රයත්න දැරීමක් වශයෙන් බර තැබීම සම්බන්ධයෙන් යම් යම් වෙනස්කම් මෙම වර්ෂය තුල දී කරන ලදී.

1966 දෙසැම්බරයේ දී, බර තැබීම සම්බන්ධයෙන් තවත් වෙනසක් කිරීමට සිදුවිය. මෙයට හේතු වූයේ, සහල් සලාකය කැපීමේ ප්‍රතිඵලයක් වශයෙන්, පාරිභෝජන රටාවේ වෙනස්කම් ඇතිවීමය. කෙසේ වෙතත්, මෙම වෙනස්කම් දර්ශකයට බලපෑවේ 1967 දීය. මූර්ත ආදායමෙහි වෙනස්වීම් නිසා එයින් මතුවන ප්‍රතිවිපාකයන් වශයෙන් පාරිභෝජන රටාවේ වෙනස්කම් ඇතිවේ; මේ වෙනස්කම් වල වැදගත්කම විශේෂයෙන් සැලසුම් කල සමීක්ෂණයකින් පමණය සොයාගත හැක්කේ. මේ නිසා ඉහත කී බර තැබීම් සම්බන්ධයෙන් කල සුලු වෙනස්කම් නිසා දර්ශකය සැහෙන තරමකට දියුණු වූවා ද යන්න සැක සහිතය.

### II සංඛ්‍යා සටහන (උ) 1

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය

(පාද වර්ෂය 1952 = 100)

| වර්ෂය | සියළුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | අංශ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර | රෙදිපිළි | ඉන්ධන හා එළිය ගෑම | ගෙවල් කුලී | විවිධ | දේශීය කොටස | ආනයන කොටස | අපනයන කොටස |
| 1958 .. | 105·0 | 105·8 | 87·5 | 101·0 | 101·5 | 113·1 | 109·2 | 97·0 | 135·0 |
| 1959 .. | 105·2 | 104·7 | 92·1 | 102·4 | 101·5 | 115·3 | 108·0 | 97·1 | 153·1 |
| 1960 .. | 103·5 | 100·8 | 95·1 | 102·7 | 101·5 | 117·5 | 108·9 | 93·7 | 138·4 |
| 1961 .. | 104·8 | 99·8 | 103·9 | 104·4 | 101·5 | 122·8 | 112·3 | 94·6 | 119·1 |
| 1962 .. | 106·3 | 100·9 | 108·2 | 105·6 | 101·5 | 124·9 | 113·9 | 96·7 | 113·8 |
| 1963 .. | 108·8 | 103·0 | 118·2 | 103·0 | 101·5 | 126·6 | 113·4 | 102·5 | 117·7 |
| 1964 .. | 112·2 | 106·4 | 127·2 | 103·2 | 101·5 | 129·3 | 116·7 | 106·6 | 115·3 |
| 1965 .. | 112·5 | 107·3 | 126·8 | 100·7 | 101·5 | 128·3 | 116·4 | 106·4 | 127·2 |
| 1966 .. | 112·3 | 109·1 | 117·0 | 95·9 | 101·5 | 127·3 | 116·8 | 105·4 | 127·6 |
| 1967 .. | 114·8 | 112·7 | 116·7 | 96·5 | 101·5 | 128·9 | 117·1 | 111·2 | 123·9 |

මූලය: සංගණන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

1961 සිට පැවති මිල වැඩිවීමේ කාල පරිච්ඡේදයකින් අනතුරුව, "සියළු ශීර්ෂ" දර්ශකය, 1965 සහ 1966 වර්ෂයන් දෙක තුළදී, ස්ථාවර තත්ත්වයකට පත් විය. 1961 සිට 1964 දක්වා වූ කාලය තුළ දී, දර්ශකයෙහි වාර්ෂික වැඩිවීමේ සාමාන්‍යය සියයට 2·35 වූ අතර, 1964 සිට 1966 දක්වා කාලය තුළ දී වැඩිවීම ඉතාමත් සුලු විය. 1966 අවසානය වනවිට, මුලින් පැවති උපනතිය නැවත දිස් වූ අතර, 1967 දී, දර්ශකය ඉහලට ගමන් කිරීමට පටන් ගති. මේ අනුව 1967 වර්ෂයේ දර්ශක සාමාන්‍යය ඊට ඉහත වර්ෂයට වඩා සියයට 2·23 කින් වැඩි විය.

ඉහත සඳහන් සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත්තා සේ, "භාණ්ඩ අනුව" සහ "අංශ අනුව" පාරිභෝගික මිල දර්ශකය බෙදා සලකා බැලීමෙන්, මෑත අවුරුදු වල දී ඇති වූ මිල වෙනස්වීම පිළිබඳව වඩා පැහැදිලි අවබෝධයක් ලබාගත හැකිය. 1967 තුළ දී, විවිධ භාණ්ඩ ගනයන්හි ඇතුළත වෙනස්වීම් සැසඳීමේ දී, ආහාර, ඉන්ධන හා එළියගන සහ විවිධ භාණ්ඩයන්හි මිල වැඩි වී ඇති බව පෙනී යන අතර, රෙදිපිළි පිළිබඳ දර්ශකය ස්ථාවර තත්ත්වයක පැවැත්තේය. (නගර සභාවෙන් පාලිත ගෙවල් කුලී යොදා ඇති, ගෙවල් කුලී පිළිබඳ දර්ශකය 1954 සිට නොවෙනස්ව පවතී.)

1962 අවසානය වන තෙක්, ආහාර වර්ග පිළිබඳ දර්ශකය පාරිභෝගික මිල සාමාන්‍යය පහත හෙළීමට පොදුවේ තුඩු දුනි. එනමුත්, ඉන්පසු වර්ෂ තුළ දී මෙය සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. මෙසේ ඉහළ යාමට හේතු වූයේ, ආහාර වර්ගයන් ආනයනය තවත් වැඩියෙන් පාලනය කිරීමෙන් උද්ගත වූ හිඟකම්ය. ආහාර වර්ග සඳහා පාරිභෝගිකයා විසින් ගෙවිය යුතු වූ සාමාන්‍ය මිල සියයට 3·3 කින් වැඩිවීම නිසා දර්ශකයෙන් ද පෙන්වා දෙන සේ 1966 දී පැවති 109·1 සිට 112·7 ට 1967 දී වැඩිවිය. 1966 දෙසැම්බරයේ දී සහල් සලාකය අඩු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ආහාර පිළිබඳ දර්ශකය ඉහළ ගියේය. සහල් සලාකය අඩු කිරීමෙන් පසු, ධාන්‍ය කොටසෙහි කළ, බර තැබීම් වෙනස් කිරීමෙන් අනතුරුව, මෙම දර්ශකයෙන්, විවෘත වෙළෙඳ පොළෙහි සහල් මිල ඉවත් නොකරන්නට මෙය තවත් ඉහළ යාමට ඉඩ තිබුණි. තිරිඟු පිටි රාත්තලක උපරිම මිල වැඩි කිරීමෙන් පසු, ධාන්‍ය කොටසෙහි සාමාන්‍ය මිල දර්ශකය තවත් ඉහළ ගියේය. තිරිඟු පිටිවල මිල අවස්ථා දෙකකදී 1966 මුල දී තිබුන ශත 23 සිට ශත 33 දක්වා 1967 අග වන විට වැඩි විය. 1967 දෙසැම්බර් මාසයේ දී, සීනි රාත්තලක මිල ශත පහකින් වැඩි කළ ද, එය වර්ෂයේ සාමාන්‍ය මිල වෙත බලපෑවේ ඉතාමත් සුළු වශයෙනි. ජාතික කිරි මණ්ඩලය 1967 මුල සිට කිරි බෝතලයක මිල ශත දහතුනකින් වැඩි කරන ලදී. මෙසේ කරන ලද්දේ කිරි නිෂ්පාදකයින් වෙත වඩාත් සතුටුදායක මිලක් දීමෙන් ඔවුන් උනන්දු කිරීමටය. වර්ෂය තුළ දී, කිරි පිටි සහ අනිකුත් කිරි නිෂ්පාදනයන්හි මිල ද ඉහල ගියේය. ආහාර කොටසෙහි අනෙකුත් සැලකිය යුතු මිල ඉහළයාම් සටහන් වී ඇත්තේ, මිරිස්, කොත්තමල්ලි, සුදුළූනු, ළූනු, දුරු වර්ග, මස්, අර්තාපල් හා අනිකුත් අල වර්ග සම්බන්ධයෙන්ය. මේ අතර මිල මට්ටමෙහි අඩුවීමක් පෙනී ගියේ, තේ කුඩු, මාළු, බිත්තර, බටර්, ජෑම්, එළවළු වර්ග සහ දියලුණු වලය. කිරි ආහාර වර්ග, මිරිස්, ළූණු සහ දුරු වර්ග ආයාතයන් තව තවත් අඩු කිරීම හේතු-කොටගෙන, වරින්වර භාණ්ඩ හිඟවීම් ඇති විය. අර්තාපල් හා අනිකුත් අල වර්ගවල මිල තියුණු අන්දමින් වැඩිවීමට හේතු වූයේ, අර්තාපල් ආනයනය සම්පූර්ණයෙන්ම නවතා දැමීමය.

1965 ට පෙර දස වර්ෂය තුල දී, රෙදිපිළි මිල දිගටම ඉහළ යාම, ජීවන වියදම් දර්ශකය ඉහල යාමට ප්‍රධාන හේතුවක් විය. කෙසේ වෙතත්, 1965 දී, සලාක ක්‍රමය අනුව, අඩු මිලකට රෙදිපිළි යම් ප්‍රමාණයක් හෝ තිබීම නිසා, දර්ශකය සුළු වශයෙන් පහල වැටුණි. ඊළඟ වර්ෂයේ දී, සිල්ලරට රෙදිපිළි බෙදා හැරීමේ ක්‍රමය වඩාත් දියුණු කරන ලද අතර, ස. තො. ස. එහි දී වැදගත් කොටසක් ඉටු කළේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1965 සිට 1966 දක්වා කාලය තුලදී දර්ශකය සියයට 7·7 තරම් ප්‍රමාණයකින් අඩු විය. 1967 වර්ෂය මුළුල්ලේම මෙම බෙදා හැරීමේ ක්‍රමය පවත්වාගෙන ගිය අතර, මේ කාලය තුළදී රෙදිපිළි මිල 1966 පැවති මට්ටමේම පැවතුනි.

ඉන්ධන සහ එළිය කොටසෙහි මිල දර්ශකය යනු, විදුලි බලය, භූමිතෙල්, ගිණිදර හා ගිණිපෙට්ටි මිල මට්ටම්හි සාමාන්‍යය යයි. 1967 දර්ශකය, 1966 ට වඩා සියය 0·6 කින් වැඩි විය. 1967 දෙසැම්බරයේ දී භූමිතෙල් ගැලුමක මිල ශත 5 කින් වැඩි කරනු

ලැබුවත් මෙම මිල වැඩිවීම දර්ශකය කෙරෙහි බලපෑවේ ඉතාමත් සුලු වශයෙනි. තවද, විදුලි බලයෙහි සහ ගිණිපෙට්ටි මිලෙහි වෙනසක් ඇතිවූයේ නැත. මේ අනුව, දර්ශකයෙහි වැඩි වීමට හේතු වී ඇත්තේ ගිණිදර මිලෙහි ඇති වූ සුලු වැඩිවීමකි.

විවිධ භාණ්ඩ කොටසෙහි සාමාන්‍ය මිලෙහි සියයට 1·1 ක වැඩිවීමක් සටහන් විය. මෙයට හේතු වූයේ, කොණ්ඩා කැපීමේ ගාස්තු, දුම්කොල, බුලත් සහ පුවක්, බෙහෙත් සහ මත් ද්‍රව්‍යයන්හි මිල ඉහල යාමය. දුම්කොල මිල වැඩි වූයේ, 1967 ජූලි මාසයේ දී, දුම්කොල රාත්තලකට රු. 4.50 ක අතිරේක භාණ්ඩ බද්දක් පැනවීම නිසාය.

1967 ජූලි මාසයේ දී ආනයන සඳහා බලපත්‍ර ගාස්තුව, භාණ්ඩවල අගයෙන් සියයයට 1 සිට සියයට 10 දක්වා වැඩි කරන ලදී. එහෙත් කිරි සහ කිරි ද්‍රව්‍ය ළදරුවන්ගේ සහ දුර්වලයන්ගේ ආහාර, කපු නූල්, බෙහෙත් වර්ග, පොහොර බූමිතෙල්, මුද්‍රණ කඩදාසි සහ සුලු කෘෂිකාර්මික උපකරණ ද ආහාර දෙපාර්තමේන්තුවේ සහ, අනෙකුත් රජයේ දෙපාර්තමේන්තුවල ආනයනද මෙයට යටත් නොවිය. මෙම අතිරේක බලපත්‍ර ගාස්තුවෙහි වියදම, පාරිභෝගිකයන් වෙත පවරා ඇති අතර, මෙම අතිරේක ගාස්තුව බලපා ඇති භාණ්ඩ වර්ගයන්හි මිල, සියයට 5 සිට 10 දක්වා වැඩි වී ඇති බව ඇස්තමේන්තු කර ඇත.

1967 දී සූවස් ඇල මාර්ගය වසා දැමීම නිසා නැව් ගමනාගමනය කේප් තුඩුව හරහා සිදුවීම හේතුකොටගෙන, නැව් සමාගම් තුනක් අමතර ගාස්තුවක් පැනවීමෙන් නැව් ගාස්තු ඉහල ගොස් ඇත. නැව් ගාස්තු වැඩිවීම, කේප් තුඩුව හරහා ආනයනය කරනු ලබන භාණ්ඩයන්හි මිල වැඩිවීමට බලපෑවාට සැකයක් නැත.

**කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට අඩංගු නොවූ මිල:-**

පාරිභෝගිකයන්ගේ වියදම් දර්ශකයට අඩංගු මිලට අතිරේක වශයෙන් ගොඩනැගිලි උපකරණ, තෙල් වර්ග හා සායම් වර්ග, ගේ දොර භාණ්ඩ !(ගෘහ භාණ්ඩ, මහන යන්ත්‍ර, උපකරණ, පිඟන් කෝප්ප යනාදිය) මෝටර් රථ අමතර කොටස් සහ පෝර වර්ග වල සිල්ලර මිල සම්බන්ධ තොරතුරු මහ බැංකුව විසින් රැස් කරනු ලැබේ. ගොඩනැගිලි උපකරණ සහ මෝටර් රථ ආධාරක හා අමතර කොටස් වැනි සමහර භාණ්ඩ වලදී වර්ග රාශියක් ඇති නිසා ද, ඒවායේ තත්ත්වයේ විවිධත්වය නිසාද විශ්වාසදායි මිල ගණන් රැස් කිරීම තරමක් අපහසුය. මිල ලේඛනයන්හි සඳහන් මිල ලබාගත හැකි වුවත්, ඒ මිල ගණන් සැලකිය හැක්කේ, පවතින මිලෙහි පහළ සීමාව ලෙසය. සමහර අවස්ථා වලදී මෙම භාණ්ඩ නොමැති-වීම නිසා, මිල ලේඛනවල ඇති මිල ගණන් කෙරෙහි රැඳීමට සිදුවිය.

1967 වර්ෂය තුලදී ගොඩනැගිලි උපකරණ වැඩි ගණනක, මිල ලේඛනයේ සඳහන් මිලෙහිද සැලකිය යුතු ඉහල යාමක් දක්නට ලැබිණ. වර්ෂය අගදී කොන්ක්‍රීට් සඳහා ගන්නා වානේ කඳන් වල මිල වර්ෂය මුලදී තිබුනාට වඩා සියයට 23 කින් වැඩි වී තිබුණි. එසේම මෙම කාලය තුලදී ඇස්බැස්ටෝස් තහඩු වල මිල සියයට 33 කින් වැඩිවිණ. ගැල්වනයිස් තහඩු වල මිල සියයට 44 සිට 60 අතර වැඩිවීමක් පෙන්නුම් කළේය. ජූලි මාසයේ දී සිදු වූ ආනයන බලපත්‍ර ගාස්තු වැඩිවීම, ඉහළ මිල ගණන් මගින් පාරිභෝගිකයා මත පැටවුණි. තවද, රුපියල අවප්‍රමාණ කළ විගසම මිල නැංවූයේ යයි පෙනෙන අතර, එම අවස්ථාවේ දී පැවති භාණ්ඩ තොග සම්බන්ධයෙන් ද මෙය කරන ලදී. එසේ නො කළ අවස්ථාවේ දී වෙළෙන්දන් අළුත් භාණ්ඩ තොග පැමිණි විට මිළ ඉහළ නංවන්නට ඇත. බොහොමයක් භාණ්ඩ සම්බන්ධයෙන් පොදු වේ මිළ ඉහල යාම සිදු වූ අතර, සායම් හා තෙල් වර්ගයනට අයත්, මිළ තරමක් දුරට ස්ථාවරව පැවැත්තේය. පොහොර වර්ග වල මිල සියයට 3 ක් අඩුවීම සැලකිය යුත්තකි.

වැටුප්

රජයේ සේවාවේ නියුතු ලිපිකාර හා කාර්මික සේවකයන්, සුළු සේවකයන් සහ ගුරුවරුන් සඳහා වැටුප් ප්‍රමාණ දර්ශකයන් මහ බැංකුව පල කරයි. වැටුප් වැඩිවීම හා අතිකාල දීමනා ආදිය හැර, මූලික වැටුප් හා ගෙවිය යුතු දීමනා ඇතුළුව, අවම වැටුප් මෙම දර්ශකයට පදනම් වන අතර, 1952 පාද වර්ෂය ලෙස සැලකේ. පඩි පාලක සභා යටතට වැටෙන වෘත්තීන්හි නියුතු කම්කරුවන්ගේ දර්ශකයන් කම්කරු දෙපාර්තමේන්තුව මගින් පල කරනු ලැබේ. මෙම දර්ශකයන්ට පදනම් වී ඇත්තේ පඩි පාලක සභා මගින් නිශ්චිත වූ අවම වැටුප් ප්‍රමාණයන්ය. ඒ මිස අතිකාල දීමනා, බෝනස් මුදල් හා දෛනික වැටුප් ලබන්නන් පිළිබඳව වැඩ කළ දින ගණන අනුව තීරණය වන නියම ඉපැයුම් නොවේ. 11 (උ) 2 සංඛ්‍යා සටහනෙන් පෙනී යන්නේ 1958 සිට 1966 අතර තුර කාලයේ දී රජයේ සේවකයන්ගේ වැටුප් දර්ශකයන් වෙනස් නොවූ බවයි. 1967 වර්ෂය තුළදී රජයේ හා පළාත් පාලන ආයතන වල සේවකයන් විශාල සංඛ්‍යාවකට අතුරු දීමනා දෙකක් මගින් වැටුප් ඉහළ නැංවීම රජයෙන් සිදුවුණි.

1967 ඔක්තෝබර් මස සිට මූලික වැටුප රුපියල් 100/- අඩු සේවකයන්ට රුපියල් 20/- කද, මූලික වැටුප රුපියල් 100/- සිට 300/- අතර ඇති සේවකයන්ට රුපියල් 10/- කද, මාසික අතුරු දීමනාවක් රජය විසින් ගෙවනු ලැබේ. රුපියල අව ප්‍රමාණ කිරීමෙන් පසුව, තවත් සහන පියවරක් වශයෙන් 1967 දෙසැම්බර් මස සිට, මාසිකාව රුපියල් 300/- කට අඩු මූලික වැටුපක් ලබන සේවකයන්ට මාස්පතා රුපියල් 15/- ක "අවප්‍රමාණ කිරීමේ අතුරු දීමනාවක්" ගෙවීමට රජය තීරණය කළේය.

මෙම වැටුප් වැඩිකිරීම් වල ප්‍රතිඵලයක් වශයෙන් 1967 සැප්තැම්බර් සිට දෙසැම්බර් මාසය දක්වා රජයේ ලිපිකරු හා කාර්මික වෘත්තීන්හි නියුතු සේවකයන්, සුළු සේවකයන් සහ පාසැල් ගුරුවරුන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකයන් පිළිවෙලින් සියයට 14.5, 25.0, සහ 10.4 ගණනේ වැඩි විය. මීට අනුකූලව පිළිවෙලින්, සියයට 10.8, 20.9 සහ 6.7 ගණනේ මූර්ත වැටුප් ප්‍රමාණය වැඩි විණ.

### II සංඛ්‍යා සටහන (උ) 2

### රජයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශක අංක

### (1952 = 100)

| වර්ෂය | ලිපිකාර හා කාර්මික වෘත්තීන්හි නියුතු සේවකයන් | | සුළු සේවකයන් | | රජයේ සේවකයන් (අ) | | රජයේ පාසැල් ගුරුවරුන් | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ |
| 1957 .. .. | 111·2 | 108·2 | 116·0 | 112·8 | 113·8 | 110·7 | 113·9 | 110·8 |
| 1958 .. .. | 122·3 | 116·5 | 130·4 | 124·3 | 126·7 | 120·7 | 117·4 | 111·8 |
| 1959 .. .. | 122·3 | 116·3 | 130·4 | 124·0 | 126·7 | 120·4 | 117·4 | 111·6 |
| 1960 .. .. | 122·3 | 118·2 | 130·4 | 126·0 | 126·7 | 122·4 | 117·4 | 113·4 |
| 1961 .. .. | 122·3 | 116·7 | 130·4 | 124·4 | 126·7 | 120·9 | 117·4 | 112·0 |
| 1962 .. .. | 122·3 | 115·0 | 130·4 | 122·6 | 126·7 | 119·2 | 117·4 | 110·4 |
| 1963 .. .. | 122·3 | 112·4 | 130·4 | 119·9 | 126·7 | 116·5 | 117·4 | 107·9 |
| 1964 .. .. | 122·3 | 109·0 | 130·4 | 116·2 | 126·7 | 112·9 | 117·4 | 104·6 |
| 1965 .. .. | 122·3 | 108·7 | 130·4 | 115·9 | 126·7 | 112·6 | 117·4 | 104·4 |
| 1966 .. .. | 122·3 | 108·9 | 130·4 | 116·1 | 126·7 | 112·8 | 117·4 | 104·6 |
| 1967 .. .. | 125·4 | 109·2 | 136·2 | 118·6 | 131·3 | 114·4 | 119·4 | 104·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ලිපිකාර හා කාර්මික වෘත්තීන්හි නියුතු සේවකයන් සහ සුළු සේවකයන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

පඩි පාලක සහා කර්මාන්තයන්හි නියුතු සේවකයන්ගේ අවම වැටුප් දර්ශකය 11 (උ) 3 සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත. කර්මාන්තයන්හි නියුතු කම්කරුවන්ගේ හා කෘෂිකාර්මික කම්කරුවන්ගේ දර්ශකයන් 1967 දී, 1966 අනුකූල දර්ශකයන්ට වඩා පිළිවෙලින් සියයට 4.3 සහ 3.7 කින් වැඩි විය. මූර්ත අවම වැටුප් ප්‍රමාණ දර්ශකය පිළිවෙලින් සියයට 2.0 සහ 1.4 කින් වැඩිවුණි.

## II සංඛ්‍යා සටහන (උ) 3

### වැටුප් පාලක සහා කර්මාන්තයන්හි කම්කරුවන්ගේ

### අවම වැටුප් ප්‍රමාණ දශික අංක

### (1952 = 100)

| වර්ෂය | කෘෂිකර්මයෙහි නියුතු කම්කරුවෝ | | කර්මාන්තයන්හි නියුතු කම්කරුවෝ | | සියළුම වැටුප් පාලක සහා කර්මාන්තයන්හි නියුතු කම්කරුවෝ (අ) | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් දශකය | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් දර්ශකය | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ |
| 1957 .. | 108·7 | 105·6 | 104·5 | 101·5 | 107·8 | 104·7 |
| 1958 .. | 110·2 | 105·2 | 116·1 | 110·9 | 110·8 | 105·6 |
| 1959 .. | 110·2 | 104·8 | 128·8 | 122·4 | 112·3 | 106·7 |
| 1960 .. | 110·2 | 106·5 | 128·1 | 123·8 | 111·8 | 108·0 |
| 1961 .. | 110·7 | 105·6 | 128·4 | 122·5 | 112·3 | 107·2 |
| 1962 .. | 111·9 | 105·2 | 129·5 | 121·8 | 113·7 | 106·9 |
| 1963 .. | 113·3 | 104·2 | 130·9 | 120·3 | 115·2 | 105·9 |
| 1964 .. | 116·0 | 103·5 | 132·8 | 118·4 | 117·8 | 105·0 |
| 1965 .. | 116·3 | 103·4 | 132·8 | 118·0 | 118·2 | 105·0 |
| 1966 .. | 116·2 | 103·5 | 133·2 | 118·6 | 118·1 | 105·1 |
| 1967 .. | 120·4 | 104·9 | 138·9 | 121·0 | 122·2 | 106·4 |

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) කෘෂිකාර්මික, කාර්මික හා වාණිජ කම්කරුවන් සඳහා වූ ඒකාබද්ධ දශිකය.

1967 වර්ෂය තුලදී, පුද්ගලික අංශයෙහි සේව්‍ය හා සේවක දෙපක්ෂය අතර ඵලදායක සාකච්ඡා කිහිපයක්ම ඇති විය. වර්ෂය තුලදී අත්සන් තැබූ සාමූහික ගිවිසුම් අතර ඉතාමත් වැදගත් ඒවා වූයේ (අ) තේ වගා කිරීම හා නිෂ්පාදක වෙළඳ අංශයේ කම්කරුවන්ගේ දෛනික වැටුපට ශත දහයක වැඩි කිරීමක් ලබා දීමට එකඟ වූ, ලංකා වතු කම්කරු සංගමයත්, ලංකා වතු සේව්‍යයන්ගේ සම්මේලනයත් අතර ඇති වූ ගිවිසුම සහ (ආ) වැටුප්හි සියයට 5 සිට 7 දක්වා, වැඩිවීමක් ලබාදීමට එකඟ වූ ලංකා වෙළඳ සේවක සංගමය සහ ලංකා සේව්‍යයන්ගේ සම්මේලනය අතර ඇති වූ ගිවිසුමත්ය.

රජය 1967 දෙසැම්බර්යේ දී "අව ප්‍රමාණ කිරීමේ අතුරු දීමනාවක්" දීමනාවක් දීමට නියම කොට කාර්මික කම්කරුවන් සඳහා දිනකට ශත 40 ක දීමනාවක්ද, කෘෂිකාර්මික කම්කරුවන් සඳහා දිනකට ශත 30 ක දීමනාවක්ද පණවන ලදී. මෙම දීමනාව කාර්මික කම්කරුවන් සම්බන්ධයෙන් මසකට රු. 10/- කට වැඩි නොවීමටත්, කෘෂිකාර්මික කම්කරුවන් සම්බන්ධයෙන් මසකට රු. 7/50 කට වැඩි නොවීමටත් නියම වුණි. නව දුරටත් ජීවන වියදම් දශිකය පදනම් කර ගත් දීමනා දෙසැම්බරයේ පැවති අගයන්හිම, නොවෙනස්ව පවත්වා තබාගන්නා අතර, මෙසේ කරනුයේ අලුත් ක්‍රමය යටතේ ගෙවන මුලු දීමනා, පැරණි ක්‍රමය යටතේ දියයුතු දීමනා වලට වඩා අඩු නොවන තෙක්ය.